# බොරු කියූ රජු ජයගත් හැටි



**කෞමිණී මැදගොඩ**

# බොරු කියූ රජු ජයගත් හැටි

**කෞමිණි මැදගොඩ**

**මහාමායා බාලිකා විදුහල**
**5 වසර** E
**2025-02-02**

IS38439

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය, ශශිකලා සේනාධීර, මහාමායා බාලිකා විද්‍යාලය
- මහනුවර.

ඉස්සර කාලෙක එක නගරයක රජෙකු ජීවත්වුණා ඔහු ඉතාමත් පොහොසත් හැබැයි එම රජතුමා වටා විශාල සේනාවක් රැස්ව සිටියා රජතුමා තමන්ගේ අවශයතා සපුරා ගැනීම සඳහා නිතර නිතර බොරු කීමට පටන් ගත්තා එම නිසා පුරෝහිතයන් මෙන්ම රටේ ජනතාවද රජතුමා කෙරෙහි අපකීර්තියට පත්වුණා



රජතුමාගේ සේවකයෝ රජතුමා බොරු කියපු හින්දා රජතුමා අතහැර ගියා

රජතුමා ගොඩක් සේවකයෝ හෙව්වා හැබැයි හැම *සේවකයෙක්ම* රජතුමා බොරු කියපු හින්දා රජතුමා අතහැර ගියා



රජතුමාට කරන්න දෙයක් නෑ රජතුමා ගොඩාක් දුක් වුනා රජතුමා

දැන් ටික ටික දුප්පත් වුනා දැන් මේ නගරයේ කට කතාවක් පැවතුණා ඒ තමා රජතුමාගේ බොරුව, රජතුමා ගොඩාක් ලැජ්ජාවට පත්වුණා.



රජතුමාට රටවැසියන්ගෙන් සැලකිලි අඩු වුණා රජතුමා අසරණ තත්ත්වයට පත්වුණා.

රජතුමා එසේ වීමට හේතුව කුමක්දැයි කල්පනා කිරීමට පටන් ගත්තා එතකොට රජතුමාට හිතුණා මම බොරු කියූ නිසාදෝ මිනිසුන් මාව අතහැර යන්නේ කියලා



රජතුමා බොරු කීම නැවැත්තුවා ආපසු රජතුමාට රටවැසියන්ගෙන් සැලකිලි වැඩි වුනා ඒ විතරක් නොව රජතුමා ටික ටික පෝසත් වුනා

රජතුමා හොයාගෙන දවසක් තරුණයෝ කිහිපදෙනෙකු පැමිණියා



රජතුමා ඇසුවා ඇයි මගේ මාලිගාවට ආවේ කියලා තරුණයෝ කිව්වා අපි ආවේ රජතුමාගේ සේවයට කියලා රජතුමා බොහොම සතුටට පත්වුණා

එදා ඉඳන් රජතුමා කවදාවත් බොරු කීවේ නම් නැහැ දැහැමිව රට පාලනය කළා



# මෙයින් සඳහන් වන්නේ බොරු කීම අයහපත් පුරුද්දක් බවය



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.